නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී

මූලික කාරණා අන්තර්ගත ලේඛනය

- **SMS සංඥා පද්ධතිය**

මූලික කාරණා අන්තර්ගත ලේඛනය - SMS සංඥා

෴	දිරිගැන්වීම් සහ ප්‍රවර්ධන ඇතුලු මූල්‍යමය සහ වෙනත් ප්‍රතිලාභ	ගාස්තු/ අයකිරීම් කොමිස් මුදල්, පොළිය	නිෂ්පාදනය/ සේවය ලබා ගැනීම සඳහා අනුගමනය කරනු ලැබිය යුතු කාර්ය පටිපාටිය සහ මූලික අවදානම්	ප්‍රධාන නියම හා කොන්දේසි
SMS සංඥා සේවය	• තනි පුද්ගලයන් සහ තනි පුද්ගලයන් නොවන ගනුදෙනුකරුවන්ට ගනුදෙනුකරුගේ කැමැත්ත පරිදි සියලු ගිණුම් සඳහා හෝ තෝරාගත් ගිණුම් සඳහා තත්කාලීන ගනුදෙනු සංඥා ලබා දීම. • ගනුදෙනුකරුගේ/ ගනුදෙනුකාරියගේ	කරුණාකර NDB බැංකුවේ ආයතනික වෙබ් අඩවියෙහි "බාගත කිරීම්" අංශයේ උඩුගත කරන ලද "ගාස්තු" පත්‍රිකාව බලන්න.	• ඇමතුම් මධ්‍යස්ථානය ඇමතීමෙන් හෝ ශාඛාවට පැමිණ "තනි පුද්ගල හෝ ආයතන ගනුදෙනුකරුවන් සඳහා වන SMS සංඥා සේවාව සඳහා ලියාපදිංචිවීමේ ආකෘතිපත්‍රය" භාරදීමෙන් දැනට සිටින ගිණුම්හිමියන්ට SMS සංඥා සඳහා ලියාපදිංචි විය හැකිය. • අලුත් ගිණුම විවෘත කරන අවස්ථාවේදී ගනුදෙනුකරුවන්ට "මැන්ඩේට් පත්‍රය" හරහා SMS සංඥා සඳහා ලියාපදිංචි විය හැකිය.	• ගනුදෙනුකරු මෙම සේවාව සඳහා බැංකුව වෙත අංකය දැනුම් දී තිබෙන නම්කළ (designated) දුරකථනයක් පමණක් භාවිත කළ යුතුය. • ගනුදෙනුකරු සෑම අවස්ථාවකදීම SIM කාඩ්පත සහ ජංගම දුරකථනය ඔහුගේ/ ඇයගේ සන්තකයෙහි තබාගත යුතුය. • ගනුදෙනුකරු මේ සේවයට ප්‍රවේශවීමේදී බැංකුවේ රීතිවලට අවනත වියයුතු අතර එසේ අවනත වීමට ගනුදෙනුකරු අපොහොසත් වන අවස්ථාවකදී ඇතිවන ආනුශංගික ප්‍රතිවිපාක ගනුදෙනුකරු විසින් භාරගනු ලැබිය යුතුය. • ගනුදෙුකරු ඔහුගේ/ ඇයගේ ගිණුම්වල බලපෑමට ලක් වූ සියලු ගනුදෙනු සඳහා සම්පූර්ණයෙන් වගකිව යුතුය.

	ගිණුම් හරහා කරන ලද සියලු ගනුදෙනුවල අදාල තොරතුරු සමඟ වාර්තාවක් ගනුදෙනුකරු වෙත ලැබීම. • SMS සංඥා සඳහා සීමාවන් සකස් කිරීමේ විකල්ප අවස්ථාව ගනුදෙනුකරුවන් සතු වීම. • සිහිකැඳවීමේ සංඥා සඳහා ගනුදෙනුකරුවන්ට "කරදර නොකරන්න" (Do Not Disturb) වේලාවන් සකස් කරගත හැකි වීම.		• ඩෙබිට් කාඩ් සඳහා ඉල්ලුම් කරන අවස්ථාවේදී, ගනුදෙනුකරුවන්ට " ඩෙබිට් කාඩ්පත් හෝ ක්‍රෙඩිට් කාඩ්පත් ඉල්ලුම් පත්‍රය" හරහා SMS සංඥා සඳහා ලියාපදිංචි විය හැකිය. **මූලික අවදානම්** • දුරකථන උපාංගය හෝ SIM කාඩ්පත නැතිවුවහොත් හෝ සොරකම් කිරීමකට ලක්වුවහොත් PIN අංක කේත, SMS සංඥා වැනි ගනුදෙනුකරුගේ බැංකු තොරතුරු එමගින් අනවසර පාර්ශ්වයන් අතට පත්විය හැකි අතර ගනුදෙනුකරු වංචා සිදුවීමේ අවදානම්වලට නිරාවරණය විය හැකිය. • SIM කාඩ්පත වැරදී තැනැත්තන් අතට පත්වීම මගින් ගනුදෙනුකරු ලෙස වෙනත් තැනැත්තකුට පෙනී සිටීමට හැකියාව ලැබීම මෙන්ම	• යම් තුන්වන පාර්ශ්වයක් විසින් එවන ලද අනවසර පණිවුඩ සඳහා බැංකුව කිසිදු වගකීමක් භාර නොගනී. • අනවසර ගනුදෙනු සම්බන්ධයෙන් කඩිනම් පියවර ගැනීම සඳහා ගනුදෙනුකරු විසින් වහාම +94112448888 අංකයෙන් NDB ඇමතුම් මධ්‍යස්ථානය ඇමතීම මගින් බැංකුව වෙත අදාල ගණුදෙනු සම්බන්ධයෙන් වාර්තා කළ යුතු ය. • සේවා සැපයීම නිශ්චය කිරීමේදී සහ නියම සහ කොන්දේසි වෙනස් කිරීමේදී අභිමතානුසාරී බලය බැංකුව සතුවේ. • SMS සංඥා සේවාව ගනුදෙනුකරුගේ ඉල්ලීම මත හෝ NDB ඇමතුම් මධ්‍යස්ථානය වෙත ඇමතීමක් ලබාදීම මගින් ඕනෑම අවස්ථාවකදී අවසන් කළ හැකිය. • බාහිර කාරණා හේතුවෙන් සිදුවන සම්ප්‍රේෂණ බිඳවැටීම් සඳහා බැංකුව වගකියනු නොලැබේ. • මෙම සේවාව සෙලියුලර් ජාල සීමාව තුළ ක්‍රියාත්මක වේ. • බැංකුව විසින් වලංගු නොවන දත්ත, ගිණුම වසා දැමීම, ටෙලිකොම් සැපයුම්කරුවන්ගේ තාක්ෂණික ගැටලු, නියම කඩ කිරීම හෝ ගනුදෙනුකරුගේ

			ගනුදෙනුකරුගේ සම්බන්ධතා, පණිවුඩ සහ වෙනත් ගිණුම් වැනි පුද්ගලික දත්ත වෙත වෙනත් තැනැත්තකුට ප්‍රවේශවීමේ හැකියාව ද ලැබෙනු ඇත. • ගනුදෙනුකරු විසින් ස්වකීය සම්බන්ධවීමේ විස්තරවල යම් වෙනස්වීමක් සිදුවීම පිළිබඳව කඩිනමින් බැංකුව වෙත දැනුම් දෙනු නොලැබුවහොත්, එමගින් ගනුදෙනු පිළිබඳ නිවේදනය කිරීම, වංචා වළැක්වීමේ පණිවුඩ හෝ එක්වරක් පමණක් ලබාදෙන මුරවචන වැනි බැංකුවෙන් ලැබෙන SMS සංඥා ගනුදෙනුකරුට නොලැබීයෑමට හේතුවිය හැකිය. • SMS සංඥා අනවසර ප්‍රවේශයට ලක්වීම මගින් සොරකම්කිරීම් හෝ වංචා සිදුවීම් විය හැකිය.	නොහැකියාව වැනි හේතු මත සේවාවන් අත්හිටුවීම හෝ අවසන් කිරීම කළ හැකිය. බැංකුව එවැනි ක්‍රියාවන් සඳහා වගකියනු නොලැබේ. • බැංකුවේ ගාස්තු උපලේඛනය ප්‍රකාරව ගාස්තු අදාල විය යුතුය. • අයකිරීම් සහ ගාස්තු අයකර නොගැනීම මත සේවාව අක්‍රීය කිරීමේ අයිතිය බැංකුව සතුවේ. • ගනුදෙනුකරු සිටින රට අනුව ගමන් කිරීමේදී ඇතිවන ගැටලු හෝ නෛතික නියෝග හේතුවෙන් සංඥා නොලැබීම සම්බන්ධයෙන් බැංකුව වගකියනු නොලැබේ. • ගනුදෙනුකරු බැංකුවේ සියලුම නියම සහ කොන්දේසිවලින් බැඳේ. • වැඩිදුර තොරතුරු සඳහා කරුණාකර NDB බැංකුවේ ආයතනික වෙබ් අඩවියෙහි "බාගත කිරීම්" අංශයේ " SMS සංඥා" යටතේ ඇති නියම සහ කොන්දේසි කියවා බලන්න.

ඔබගේ පසුවිපරම අප සමග හුවමාරු කරගන්න

සියලු අවස්ථාවලදී ඔබ සෑහීමට පත්වන ආකාරයට ඔබවෙත අපගේ සේවා සැපයීම සඳහා අප ඇපකැපවී සිටින්නෙමු.

අප විසින් ඔබගේ අපේක්ෂාවන් කොතරම් හොඳින් ඉටුකර ඇද්ද යන්න පිළිබඳව දැනගැනීම සඳහා සහ අවශ්‍ය අවස්ථාවලදී දියුණු කරගතයුතු කරුණු පිළිබඳව දැනුවත්වීම සඳහා ඔබගේ පසුවිපරම අප හට උපකාරීවනු ඇත.

ඔබගේ පසුවිපරම හුවමාරු කරගත යුතු ආකාරය:

ඔබට ඔබගේ ශාඛා කළමනාකරු හෝ ඔබගේ සම්බන්ධතා කළමනාකරු හා සම්බන්ධ විය හැකි ය.

අංක. +94(1) 11 2448888 දරන පැය 24 පුරා ක්‍රියාත්මකවන ඇමතුම් මධ්‍යස්ථාන අංකය අමතන්න.

අප වෙත විද්‍යුත් තැපෑලෙන් යොමු කරන්න:- contact@ndbbank.com

ලිඛිතව ඉදිරිපත් කරන්න:- කළමනාකරු, ගනුදෙනුකාර සම්බන්ධතා කළමනාකාර අංශය, නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පීඑල්සී අංක. 40 නවම් මාවත, කොළඹ 02

අප විසින් ප්‍රතිචාර දක්වන ආකාරය;

පැමිණිල්ල ලැබීමෙන් පසුව, අප විසින් එය බැංකුවේ පැමිණිලි සම්බන්ධයෙන් ක්‍රියාකිරීමේ පද්ධතියෙහි වාර්තාකර එම ගැටලුව වහාම විසඳීම සඳහා උත්සාහ කරන්නෙමු. අපට එසේ ක්‍රියාකිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, අප විසින් ඔබ වෙත වැඩකරන දින තුනක් ඇතුලත විසඳුමක් ලබා දෙන්නෙමු. පැමිණිල්ලේ ස්වභාවය අනුව මෙම කාලසීමාව තුලදී මෙම ගැටලුව විසඳීමට අපට නොහැකි වුවහොත්, අප විසින් ඔබවෙත ප්‍රතිචාර දක්වනු ලබන ඇස්තමේන්තුගත කාලය පිළිබඳව ඔබව දැනුවත් කරන්නෙමු.

ඔබගේ ගැටළුවට අපෙන් ලැබුණු පිළිතුර පිළිබඳව ඔබ කිසිසේත් සෑහීමට පත් නොවන්නේ නම්, ඔබට ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය හෝ ශ්‍රී ලංකා මහා බැංකුවේ මූල්‍ය පාරිභෝගික සම්බන්ධතා අංශය (FCRD) අමතා සම්බන්ධ විය හැකිය.

ශ්‍රී ලංකා මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය (Office of The Financial Ombudsman - SL)
සන්ද්‍යානී විජේසිංහ මිය
මූල්‍ය ඔම්බුඩ්ස්මන් කාර්යාලය, නො. 01, බෙනෙස්දා පෙදෙස , මිලාගිරිය, කොළඹ 05.
කාර්යාල දුරකථන අංකය: +94 11 259 5624 ටෙලි/ෆැක්ස්: +94 11 259 5625
විද්‍යුත් තැපෑල: fosril@sltnet.lk වෙබ් අඩවිය: www.financialombudsman.lk

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව (CBSL - FCRD)
මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා මහ බැංකුව, නො. 30, ජනාධිපති මාවත, කොළඹ - 01.
විමසීම් සඳහා ක්ෂණික ඇමතුම් (Hotline): 1935
දුරකථන: +94 112 477 966 ෆැක්ස්: +94 112 477 744
විද්‍යුත් තැපෑල: fcrd@cbsl.lk